රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 116

මගේ අංකය: 2/9/156/15/1/එච්(නව).
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 1977.11.28.

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්ෂණ.

1974 ඔක්තෝබර් 11 දිනැති අංක.61 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3 හා 6 ඡේද වෙත අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

2. ඉහත සඳහන් විභාගය සඳහා දැනට ඉල්ලුම් පත් කැඳවන ක්‍රමය නිසා අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවන බව විභාග කොමසාරිස් මගේ සැලකිල්ලට ලක්කොට තිබේ. මේ තත්ත්වය මග-හරවනු වස්, මින් ඉදිරියට එක් එක් විභාගාපේක්ෂකයා වෙතින්, වෙන වෙනම අයදුම් පත බැගින් කැඳවීමට තීරණය කර ඇත.

3. විභාගය පවත්වන බවට, විභාග කොමසාරිස් ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කළපසු, මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත අනුව, එක් එක් ශ්‍රේණි වෙනුවෙන් වෙන වෙනම අයදුම් කරන ලෙස විභාගාපේක්ෂකයනට දැන්විය යුතුවේ. සිය කාර්යාලයේ/ ආයතනයේ අය වෙනුවෙන් ඉදිරිපත් වන අයදුම් පත්, නිවරදිව සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂාකර බලා, සහතික කොට, ශ්‍රේණි අනුව වෙන වෙනම සකස් කරන ලද උපලේඛනයක ස්වරූපය ගත් ආවරණ ලිපියක් සමඟ, විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි තැපෑලෙන් කෙලින්ම එවීමට දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් නොපමාවම පියවර ගතයුතුය.

4. ඇතුළත්වීමේ ලැයිස්තුවේ දෙවැනි පිටපත මගින් ප්‍රතිචාර නිකුත් කිරීමේ කලින් පිළිවෙත වෙනුවට යෝග්‍ය පිළිවෙලක් විභාග කොමසාරිස් අනුගමනය කරනු ඇත.

5. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු තම තමන්ගේ අමාත්‍යාංශ යටතේ ඇති රජයේ දෙපාර්තමේන්තු හා [illegible] මණ්ඩලවල සියලුම සේවකයිනට දැනගැනීමට කරුණාකර සලස්වන්න.

අ.ක/ ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

ආයතන අධ්‍යක්ෂ

## <u>ආදර්ශ අයදුම් පත.</u>

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**
**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සිංහල**
**ප්‍රවීණතා (ලිඛිත) පරීක්ෂණය.**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. 1. නම (මුලකුරු සමග) :
    11. මුලකුරුවලින් හැඳින්වෙන නම් :

02. නිලය හා සේවය :

03. ප්‍රවේශ පත් යැවීම සඳහා කාර්යාලීය ලිපිනය :

04. දිස්ත්‍රික්කය :

05. දෙපාර්තමේන්තුව :

06. ප්‍රාදේශීය කාර්යාලය / උප කාර්යාලය :

07. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ පාලනයට යටත්වන ඒකාබද්ධ සේවයේ නියුක්තද?

| ඔව් | නැත |
|---|---|
| | |

08. අයදුම් කරන ශ්‍රේණිය :
(පැහැදිලිව සඳහන් කරන්න. එක් වතාවකදී අයදුම් කළයුත්තේ එක් ශ්‍රේණියකට පමණි. ඉල්ලුම් කරන ලද ශ්‍රේණිය කිසිම හේතුවක් නිසාවත් වෙනස් කරනු නොලැබේ.)

. . . . . . . . . .
අයදුම්කරුගේ අත්සන.

දිනය:

73.10.24 දිනැති අංක.74 හා 74.10.11 දිනැති අංක.91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ඉහත නම් සඳහන් නිලධාරියා ඉහත කී විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරයි. ඔහුට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇතිබව සහතික කරමි. තවද ඉහත සඳහන් අංක. 91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය යටතේ ඇති සෑම උපදෙසක්ම පිළිපැද ඇත.

. . . . . . . . . . . .
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

නිල මුද්‍රාව

දිනය:-